## වේයන්ගොඩ ගුවන්පාලම් ව්‍යාපෘතිය - 2012

### 1. මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව ,

(ඇ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන් වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

### 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය ප්‍රකාශන සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව , 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතියේ වියදම රු.මිලියන 542.39 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම් පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වර්ගය | 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වියදම |
|---|---|
| | රු. |
| ගුවන් පාලම් පිරිවැය | 268,764,065 |
| ව්‍යාපෘති කළමනාකරණ පිරිවැය | 5,110,784 |
| ජංගම වත්කම් | 268,513,624 |
| | 542,388,473 |

### 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් කාලපරිච්ඡේදය සඳහා ව්‍යාපෘතියේ මූල්‍යනය අයවැය ප්‍රතිපාදනය හා අරමුදල් උපයෝජනය පිළිබඳ සමහර වැදගත් සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

| මූලාශ්‍රය | ණය ගිවිසුම් අනුව සැපයීමට එකඟ වූ මුදල | | 2012 වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය | සමාලෝචිත කාලපරිච්ඡේදය සඳහා අරමුදල් උපයෝජනය |
|---|---|---|---|---|
| | යූරෝ මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| ස්පාඤ්ඤය | 11.22 | 1,814 | - | 517.5 |
| ශ්‍රී ලංකා රජය | - | 550 | 150 | 2.0 |
| එකතුව | 11.22 | 2,364 | 150 | *519.5 |

* වර්ෂ අවසානයේ ගෙවිය යුතු වියදම් අන්තර්ගත නොවන බැවින් මෙම වාර්තාවේ 4 ඡේදයේ දැක්වෙන සංඛ්‍යා සමඟ මෙම සංඛ්‍යා එකඟ නොවේ.